සියලුම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

I පත්‍රය - ලකුණු 1 x 40 = මුළු ලකුණු 40

II පත්‍රය - ප්‍රශ්න අංකය 01 අනිවාර්ය ප්‍රශ්නය කි.

ලකුණු 20 යි

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 2 | - | ලකුණු | 08 | (ඕනෑම ප්‍රශ්න 02 කට) |
| ප්‍රශ්න අංක 3 | - | ලකුණු | 08 | ලකුණු 2 x 8 = 16 යි |
| ප්‍රශ්න අංක 4 | - | ලකුණු | 08 | |

II කොටස - ගිණුම්කරණය

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 5 | - | ලකුණු | 12 | (ඕනෑම ප්‍රශ්න 2කට) |
| ප්‍රශ්න අංක 6 | - | ලකුණු | 12 | ලකුණු 2 x 12 = 24 යි |
| ප්‍රශ්න අංක 7 | - | ලකුණු | 12 | |

මුළු ලකුණු 60 යි

අවසාන ලකුණු ගණනය කිරීම

| | | |
|---|---|---|
| I පත්‍රයට මුළු ලකුණු | = | 40 |
| II පත්‍රයට මුළු ලකුණු | = | 60 |
| අවසාන ලකුණු | = | 100 |

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..............................................
..............................................
.............................................. √ △ $\frac{4}{5}$

(ii) ..............................................
..............................................
.............................................. √ △ $\frac{3}{5}$

(iii) ..............................................
..............................................
.............................................. √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***

## අවසාන ලකුණු සකස් වන්නේ පහත පරිදි ය.

| | | |
|---|---|---|
| • I පත්‍රයට ලකුණු | | 40 |
| • II පත්‍රයට | | |
| පළමුවන ප්‍රශ්නයට ලකුණු | | 20 |
| I කොටස - ව්‍යාපාර අධ්‍යයනය | - ප්‍රශ්න 02 (02 x 08) | 16 |
| II කොටස - ගිණුම්කරණය | - ප්‍රශ්න 02 (02 x 12) | <u>24</u> |
| මුළු ලකුණු | | <u>100</u> |

අනු කොටස්වලට හිමි අවසාන ලකුණු දැක්වීමේ දී පැහැදිලි ව පෙන්විය යුතු ය.

නිදසුන් : i. $\frac{2}{2}$ ii. $\frac{1}{2}$ iii. $\frac{2}{2}$ iv. $\frac{1}{2}$ = $\frac{06}{08}$

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
## II - පත්‍රය

**01. ප්‍රශ්නය**

| | | | |
|---|---|---|---|
| (i). | ලකුණු | 02 | |
| (ii). | ලකුණු | 02 | |
| (iii). | ලකුණු | 02 | |
| (iv). | ලකුණු | 02 | |
| (v). | ලකුණු | 02 | |
| (vi). | ලකුණු | 02 | |
| (vii). | ලකුණු | 02 | |
| (viii). | ලකුණු | 02 | |
| (ix). | ලකුණු | 02 | |
| (x). | ලකුණු | 02 | මුළු ලකුණු 20 යි |

## I - කොටස
## ව්‍යාපාර අධ්‍යයනය

**02. ප්‍රශ්නය**

| | | | |
|---|---|---|---|
| (i). | ලකුණු | 02 | |
| (ii). | ලකුණු | 02 | |
| (iii). | ලකුණු | 02 | |
| **(iv).** | ලකුණු | 02 | මුළු ලකුණු 08 යි |

**03. ප්‍රශ්නය**

| | | | |
|---|---|---|---|
| (i). | ලකුණු | 02 | |
| (ii). | ලකුණු | 02 | |
| (iii). | ලකුණු | 02 | |
| (iv). | ලකුණු | 02 | මුළු ලකුණු 08 යි |

**04. ප්‍රශ්නය**

| | | | |
|---|---|---|---|
| (i). | ලකුණු | 02 | |
| (ii). | ලකුණු | 02 | |
| (iii). | ලකුණු | 02 | |
| (iv). | ලකුණු | 02 | මුළු ලකුණු 08 යි |

## II - කොටස
## ගිණුම්කරණය

**05. ප්‍රශ්නය**

| | | | |
|---|---|---|---|
| (i). | ලකුණු | 02 | |
| (ii). | ලකුණු | 02 | |
| (iii). | ලකුණු | 04 | |
| (iv). | ලකුණු | 04 | මුළු ලකුණු 12 යි |

**06. ප්‍රශ්නය**

| | | | |
|---|---|---|---|
| (i). | ලකුණු | 02 | |
| (ii). | ලකුණු | 02 | |
| (iii). | ලකුණු | 04 | |
| (iv). | ලකුණු | 04 | මුළු ලකුණු 12 යි |

**07. ප්‍රශ්නය**

| | | | |
|---|---|---|---|
| (i). | ලකුණු | 02 | |
| (ii). | ලකුණු | 02 | |
| (iii). | ලකුණු | 08 | මුළු ලකුණු 12 යි |

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

2018.12.12 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'ළඟම පාසල හොඳම පාසල' සංකල්පයට අනුව මෑතකදී නව විද්‍යාගාරය ඇතුළු පාසලේ ගොඩනැගිලි සංවර්ධනය කෙරුණු නෙළුම්විල මහා විද්‍යාලයේ 2017 වර්ෂයේ අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් විශිෂ්ට ලෙස සමත් ව දැනට රවීමල් සමාගමේ තාවකාලික රැකියාවක නියුතු සමාධි විශ්වවිද්‍යාලයට තේරී ඇති බව දන්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ඇයට ලිපියක් එවා ඇත.

**1.** ඉහත සිද්ධියේ සඳහන් නෙළුම්විල මහා විද්‍යාලය මගින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?
(1) සෞඛ්‍යය (2) නිවාස (3) ආරක්ෂාව (4) අධ්‍යාපනය

**2.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
(1) රාජ්‍ය සංස්ථා ය. (2) රජයේ දෙපාර්තමේන්තු ය.
(3) රාජ්‍ය සමාගම් ය. (4) සංස්ථාපිත සමාගම් ය.

**3.** ඉහත සිද්ධිය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 'ළඟම පාසල හොඳම පාසල' සංකල්පය, ආර්ථික පරිසර සාධකයකි.
(2) පාසලේ ගොඩනැගිලි, භූමිය යන නිෂ්පාදන සාධකයට අයත් වේ.
(3) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, සේවා සපයන ව්‍යාපාරයකි.
(4) නෙළුම්විල මහා විද්‍යාලයේ සිසුන්, එම විද්‍යාලයේ බාහිර පරිසර සාධකයකි.

**4.** ඉහත සිද්ධියේ සඳහන් සන්නිවේදනයට අදාළ යවන්නා, පණිවුඩය, මාධ්‍යය හා ලබන්නා පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) සමාධි → සමාධි විශ්වවිද්‍යාලයට තෝරාගෙන ඇත → ලිඛිත → විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
(2) සමාධි → ලිඛිත → සමාධි විශ්වවිද්‍යාලයට තෝරාගෙන ඇත → විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
(3) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව → සමාධි විශ්වවිද්‍යාලයට තෝරාගෙන ඇත → ලිඛිත → සමාධි
(4) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව → ලිඛිත → සමාධි විශ්වවිද්‍යාලයට තෝරාගෙන ඇත → සමාධි

**5.** ඉහත සිද්ධියේ සඳහන් රවීමල් සමාගම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(2) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.
(3) මෙම ව්‍යාපාරයේ අයිතිකරුගේ වගකීම සීමිත වේ.
(4) මෙම ව්‍යාපාරය රාජ්‍ය අංශයේ ව්‍යාපාර ආයතනයකි.

6. ගොවියකු තම ව්‍යාපාරයට ගංවතුර නිසා සිදු වූ අලාභය ද දරා ගනිමින් සාර්ථකව ව්‍යාපාරය කර ගෙන යාම, අයත් වන නිෂ්පාදන සාධකය කුමක් ද?
(1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසායකත්වය

7. ශ්‍රී ලංකා රුපියලේ අගයට සාපේක්ෂව ඇමරිකානු ඩොලරයේ අගය ඉහළ යාම ඇඟලුම් අපනයනය කරන සමාගමකට
(1) අභ්‍යන්තර පරිසර සාධකයකි. (2) ආර්ථික පරිසර සාධකයකි.
(3) නෛතික පරිසර සාධකයකි. (4) තාක්ෂණික පරිසර සාධකයකි.

- පහත සිද්ධිය ඇසුරෙන් අංක **8** හා **9** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


ලංකා බැංකුවේ ජංගම ගිණුමක් හිමි සුභාෂ් කවිරත්න, තම ගනුදෙනුකරුවකු වන දීපාල් සමරදිවාකර වෙත රු. 100 000 ක චෙක්පතක් නිකුත් කළ අතර, දීපාල් සමරදිවාකර එය බැංකු කවුන්ටරයෙන් මුදල් කර ගත්තේ ය.


8. මෙම චෙක්පතේ අණලද්දා හා ආදායකයා පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ලංකා බැංකුව හා දීපාල් සමරදිවාකර (2) දීපාල් සමරදිවාකර හා ලංකා බැංකුව
(3) ලංකා බැංකුව හා සුභාෂ් කවිරත්න (4) සුභාෂ් කවිරත්න හා දීපාල් සමරදිවාකර

9. මෙම සිද්ධියට අදාළව නිකුත් කරන ලද චෙක්පත,
(1) සාමාන්‍ය රේඛනය සහිත චෙක්පතකි. (2) විශේෂ රේඛනය සහිත චෙක්පතකි.
(3) රේඛනය නොකළ චෙක්පතකි. (4) බැංකු ජංගම ගිණුමක තැන්පත් කළ නොහැකි ය.

10. රක්ෂණයට සම්බන්ධ පළමු පක්ෂය.........①......... ලෙස හඳුන්වන අතර දෙවන පක්ෂය.........②......... ලෙස හැඳින්වේ.
ඉහත ප්‍රකාශයේ ① හා ② ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) රක්ෂකයා, රක්ෂිතයා (2) රක්ෂිතයා, රක්ෂකයා
(3) රක්ෂණ ආයතනය, රක්ෂිතයා (4) රක්ෂකයා, රක්ෂණ ආයතනය

11. විද්‍යුත් නොවන සංඥා සන්නිවේදන ක්‍රමයක් දැක්වෙන රූපසටහන කුමක් ද?


(1)


(2)


(3)


(4)

12. පහත **X** තීරුවේ ප්‍රවාහනය හා සම්බන්ධ සිදුවීම් කිහිපයක් ද, **Y** තීරුවේ ප්‍රවාහන මූලිකාංග ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. 1990 ගිලන් රථ සේවාව දීප ව්‍යාප්තව පුළුල් කිරීම | A - මාර්ගය |
| 2. උතුරු අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම | B - මාධ්‍යය |
| 3. පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ නවීකරණය කිරීම | C - බලය |
| 4. ලෝක වෙළෙඳපොළේ බොර තෙල් මිල අනුව ඉන්ධන මිල සංශෝධනය කිරීම | D - පර්යන්තය |

ඉහත **X** තීරුවේ සඳහන් සිදුවීම් **Y** තීරුවේ සඳහන් ප්‍රවාහන මූලිකාංග සමග පිළිවෙළින් ගළපන ලද පිළිතුර තෝරන්න.
(1) A, B, D හා C (2) B, A, C හා D (3) B, A, D හා C (4) B, C, A හා D

- පහත සිද්ධිය ඇසුරෙන් අංක **13** හා **14** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පොත් ප්‍රකාශකයෙක් කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශන භූමියේ ප්‍රධාන පිවිසුම් දොරටුව අසලින් තමාගේ වෙළෙඳ කුටිය වෙන් කර ගැනීමට තීරණය කර සේවකයකු ද බඳවා ගත්තේ ය.

13. මෙම සිද්ධියේ ඇතුළත් කළමනාකරණ කාර්ය දෙක වන්නේ,
(1) සැලසුම්කරණය හා මෙහෙයවීමයි. (2) සැලසුම්කරණය හා සංවිධානකරණයයි.
(3) සංවිධානකරණය හා පාලනයයි. (4) මෙහෙයවීම හා සංවිධානකරණයයි.

14. මෙම සිද්ධියේ සඳහන් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය දෙක වන්නේ,
(1) ප්‍රවර්ධනය හා නිෂ්පාදිතයයි. (2) ප්‍රවර්ධනය හා ස්ථානයයි.
(3) නිෂ්පාදිතය හා ස්ථානයයි. (4) නිෂ්පාදිතය හා මිලයි.

**15.** භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධව **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ආයෝජකයකුට භාණ්ඩාගාර බිල්පත් මිල දී ගත හැක්කේ ප්‍රාථමික වෙළෙඳුන් මගිනි.
(2) භාණ්ඩාගාර බිල්පත් යනු අවදානම් රහිත ආයෝජනයකි.
(3) භාණ්ඩාගාර බිල්පත් රජයේ දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීමට යොදා ගැනේ.
(4) භාණ්ඩාගාර බිල්පත්වලට පූර්ණ රාජ්‍ය ආරක්ෂාව පවතී.

**16.** ආයෝජකයකු රජයේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභයට වඩා ඉහළ ප්‍රතිලාභයක් සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීමෙන් බලාපොරොත්තු වේ. මෙයට හේතුව වන්නේ සාමාන්‍ය කොටස්වල පවතින
(1) පහළ අවදානම ය.
(2) ඉහළ අවදානම ය.
(3) ඉහළ පොලී ආදායම ය.
(4) ඉහළ රාජ්‍ය ආරක්ෂාව ය.

**17.** මූලික ගිණුම්කරණ සමීකරණය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වත්කම් + වගකීම් = හිමිකම්
(2) වත්කම් − වගකීම් = හිමිකම්
(3) වත්කම් + හිමිකම් = වගකීම්
(4) හිමිකම් − වගකීම් = වත්කම්

**18.** සේවක වැටුප් රු. 8 000 ක් ගෙවීම නිසා ව්‍යාපාරයක,
(1) වත්කම් රු. 8 000 කින් අඩු වී, හිමිකම් රු. 8 000 කින් අඩු වේ.
(2) වත්කම් රු. 8 000 කින් අඩු වී, හිමිකම් රු. 8 000 කින් වැඩි වේ.
(3) වත්කම් රු. 8 000 කින් වැඩි වී, වගකීම් රු. 8 000 කින් වැඩි වේ.
(4) හිමිකම් රු. 8 000 කින් අඩු වී, වගකීම් රු. 8 000 කින් වැඩි වේ.

**19.** කසුන්ගේ ව්‍යාපාරයේ 2018.01.01 දිනට හිමිකම රු. 150 000 ක් වූ අතර 2018.01.31 දිනට හිමිකම රු. 170 000 ක් විය. මෙම කාලය තුළ ව්‍යාපාරයේ එක් ගනුදෙනුවක් පමණක් සිදු වූයේ නම්, එම ගනුදෙනුව වන්නේ,
(1) රු. 170 000 ක ප්‍රාග්ධනය යෙදවීම ය.
(2) අයිතිකරු විසින් රු. 20 000 ක භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම ය.
(3) පිරිවැය රු. 60 000 ක් වූ තොගයක් රු. 40 000 කට ණයට විකිණීම ය.
(4) පිරිවැය රු. 40 000 ක් වූ තොගයක් රු. 60 000 කට අත්පිට මුදලට විකිණීම ය.

**20.** ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවක් සහ එම ගනුදෙනුව සටහන් කිරීමට අදාළ අසම්පූර්ණ ද්විත්ව සටහන පහත දැක්වේ.

- ණයගැතියකුගේ රු. 25 000 ක් වූ ගිණුම පියවීම සඳහා රු. 22 000 ක් මුදලින් ලැබීම

| | | රු. |
|---|---|---|
| • මුදල් ගිණුම | හර | 22 000 |
| ............①............ ගිණුම | හර | ......②...... |
| ණයගැති ගිණුම | බැර | ......③...... |

ඉහත ප්‍රකාශයේ ①, ② සහ ③ යන ස්ථානවලට අදාළ නිවැරදි අයිතම පිළිවෙළින්,
(1) දුන් වට්ටම්, රු. 3 000 හා රු. 25 000 වේ.
(2) ලද වට්ටම්, රු. 3 000 හා රු. 25 000 වේ.
(3) දුන් වට්ටම්, රු. 3 000 හා රු. 22 000 වේ.
(4) ලද වට්ටම්, රු. 3 000 හා රු. 22 000 වේ.

**21.** ද්විත්ව සටහන් රීතිය සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) වැඩිවීම් හර, අඩුවීම් බැර යන ද්විත්ව සටහන් රීතිය අදාළ වන්නේ වගකීම් ගිණුම්වලට ය.
(2) වැඩිවීම් හර, අඩුවීම් බැර යන ද්විත්ව සටහන් රීතිය අදාළ වන්නේ හිමිකම් ගිණුම්වලට ය.
(3) වැඩිවීම් බැර, අඩුවීම් හර යන ද්විත්ව සටහන් රීතිය අදාළ වන්නේ ආදායම් ගිණුම්වලට ය.
(4) වැඩිවීම් බැර, අඩුවීම් හර යන ද්විත්ව සටහන් රීතිය අදාළ වන්නේ වත්කම් ගිණුම්වලට ය.

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **22** හා **23** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පසිඳු පොත් ප්‍රකාශකයෝ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A - රු. 250 000 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රයක් ණයට ගැනීම
B - රු. 50 000 ක් වටිනා මුද්‍රණ කඩදාසි රුවන්ගෙන් ණයට ගැනීම
C - මොරටු ලී බඩු සමාගමෙන් රු. 100 000 ක් වටිනා ලී බඩු උපකරණ ණයට ගැනීම
D - පිරිවැය රු. 100 000 ක් වූ පොත් තොගයක් රු. 160 000 කට ණයට විකිණීම

**22.** ඉහත ගනුදෙනුවලින් ගැනුම් ජර්නලයේ සටහන් කරන ගනුදෙනුව වන්නේ,
(1) A ය.   (2) B ය.   (3) C ය.   (4) D ය.

**23.** ඉහත ගනුදෙනුවලින් A, B හා D යන ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ජර්නල් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය හා ගැනුම් ඉන්වොයිසිය
(2) ජර්නල් වවුචරය, ගැනුම් ඉන්වොයිසිය හා විකුණුම් ඉන්වොයිසිය
(3) ගෙවීම් වවුචරය, ගැනුම් ඉන්වොයිසිය හා විකුණුම් ඉන්වොයිසිය
(4) ගැනුම් ඉන්වොයිසිය, ජර්නල් වවුචරය හා විකුණුම් ඉන්වොයිසිය

**24.** කපිලගේ ව්‍යාපාරයේ 2018 ඔක්තෝබර් මාසය සඳහා ලද බැංකු ප්‍රකාශයේ බැර ශේෂය රු. 12 000 කි. මෙය,
(1) ව්‍යාපාරයේ වත්කමකි.
(2) ව්‍යාපාරයේ වගකීමකි.
(3) බැංකුවේ වත්කමකි.
(4) ව්‍යාපාරයේ බැංකු අයිරාවකි.

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **25** හා **26** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සඳුන්ගේ ව්‍යාපාරයේ 2018.07.31 දින සුළු මුදල් භාරකරු ළඟ ඉතිරි මුදල රු. 2 500 කි. 2018 ජූලි මාසයේ සුළු මුදල් විශ්ලේෂණ තීරුවල ශේෂ පහත දැක්වේ.

| | |
|---|---|
| ලිපිද්‍රව්‍ය | රු. 2 500 |
| ගමන් ගාස්තු | රු. 1 800 |
| සංග්‍රහ වියදම් | රු. 2 000 |
| විවිධ වියදම් | රු. 1 200 |

සඳුන් 2018.08.01 දින සිට සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 15 000 ක් දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදී.

**25.** මෙම ව්‍යාපාරයේ 2018 ජූලි මාසයේ සුළු මුදල් වියදම්වල වටිනාකම
(1) රු. 2 500 කි. (2) රු. 7 500 කි. (3) රු. 10 000 කි. (4) රු. 15 000 කි.

**26.** 2018.08.01 දිනට සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කළ යුතු වටිනාකම වන්නේ,
(1) රු. 2 500 කි. (2) රු. 5 000 කි. (3) රු. 12 500 කි. (4) රු. 15 000 කි.

**27.** අයිතිකරු රු. 5 000 ක අතිරේක ප්‍රාග්ධනයක් යෙදවීම සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත පිළිවෙළින්,
(1) මුදල් පොත හා ලදුපතයි.
(2) පොදු ජර්නලය හා ලදුපතයි.
(3) ලදුපත හා පොදු ජර්නලයයි.
(4) ලදුපත හා මුදල් පොතයි.

**28.** ව්‍යාපාරයක් 2018.03.31 දින පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු. 800 000 වූ අතර බැර තීරුවේ එකතුව රු. 825 000 ක් විය. මෙම වෙනසට හේතු වූ ගිණුම්කරණයේදී සිදු වූ වරද වන්නේ,
(1) දුන් වට්ටම් ගිණුමේ එකතුව රු. 25 000 කින් වැඩි වීම ය.
(2) විකුණුම් ගිණුමේ එකතුව රු. 25 000 කින් වැඩි වීම ය.
(3) ගැනුම් ගිණුමේ එකතුව රු. 25 000 කින් වැඩි වීම ය.
(4) ලද වට්ටම් ගිණුමේ එකතුව රු. 25 000 කින් අඩු වීම ය.

**29.** ව්‍යාපාරය විසින් සුමනදාසගෙන් ණයට ගත් රු. 45 000 ක් වටිනා බඩු තොගය සුමනදාසගේ ගිණුමේ රු. 54 000 ක් ලෙස සටහන් කර ඇත. මෙම ගිණුම්කරණ වරද නිවැරදි කිරීම වාර්තා කළ යුතු මූලික පොත,
(1) පොදු ජර්නලයයි.
(2) ගැනුම් ජර්නලයයි.
(3) මුදල් පොතයි.
(4) විකුණුම් ජර්නලයයි.

**30.** සේසත් ක්‍රීඩා සමාජයට අදාළ පහත ගනුදෙනු අතුරෙන් ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් **නොවන** ගනුදෙනුව කුමක් ද?
(1) පුවත්පත් අලෙවියෙන් ලැබීම රු. 1 000
(2) ක්‍රීඩා උපකරණ ගැනීම රු. 15 000
(3) පරිත්‍යාග ලැබීම රු. 5 000
(4) ප්‍රවාහන වියදම් ගෙවීම රු. 2 500

**31.** මල් පෝච්චි නිෂ්පාදන ව්‍යාපාරයක 2018 ඔක්තෝබර් මාසයේ මුළු නිෂ්පාදන පිරිවැය රු. 150 000 ක් වූ අතර මාසය තුළදී නිෂ්පාදනය කළ මල් පෝච්චි ගණන 500 කි. මල් පෝච්චියක නිෂ්පාදන පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් තබා ගන්නේ නම් මල් පෝච්චියක විකුණුම් මිල කොපමණ ද?
(1) රු. 240 (2) රු. 300 (3) රු. 360 (4) රු. 500

**32.** පහත වගුවෙහි **X** තීරුවේ නිෂ්පාදන ආයතනවල වියදම් අයිතම කිහිපයක් ද, **Y** තීරුවේ නිෂ්පාදන පිරිවැය මූලිකාංග කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. උළු නිෂ්පාදන ආයතනයක විදුලිය සඳහා වියදම | A - වක්‍ර ශ්‍රම පිරිවැය |
| 2. ඇඟලුම් නිෂ්පාදන ආයතනයක ඇඳුම් මසන්නන්ගේ වැටුප් | B - සෘජු වෙනත් පිරිවැය |
| 3. පාවහන් නිෂ්පාදන ආයතනයක මුරකරුගේ වැටුප | C - සෘජු ශ්‍රම පිරිවැය |
| 4. පොත් ප්‍රකාශන ආයතනයක කර්තෘභාගය | D - වක්‍ර වෙනත් පිරිවැය |

ඉහත **X** තීරුවේ සඳහන් වියදම් අයිතම **Y** තීරුවේ සඳහන් නිෂ්පාදන පිරිවැය මූලිකාංග සමග පිළිවෙළින් ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) B, A, C හා D (2) B, C, A හා D (3) D, C, A හා B (4) D, C, B හා A

**33.** කුමුදු 2017.04.01 දින තම ව්‍යාපාරයෙන් ඉපයූ රු. 100 000 ක් 12% ක වාර්ෂික පොලියකට ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළේ ය. වාර්ෂික පොලිය 2018.03.31දින ලැබීමට නියමිත ය.
2017.12.31 දිනෙන් අවසන් වර්ෂයට මෙම ව්‍යාපාරයේ පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව

(1) ආදායම් ප්‍රකාශයේ දැක්වෙන පොලී ආදායම රු. 12 000 කි.
(2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන ලැබිය යුතු පොලී ආදායම රු. 12 000 කි.
(3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන ලැබිය යුතු පොලී ආදායම රු. 9 000 කි.
(4) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන ලැබිය යුතු පොලී ආදායම රු. 3 000 කි.

**34.** ව්‍යාපාරයක් 2016.01.01දින රු. 500 000 ක් වටිනා යන්ත්‍රයක් මිල දී ගත් අතර එහි ඵලදායී ජීව කාලය වර්ෂ 5 කි. එම කාලය අවසානයේ යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 50 000 කි.
ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ආදායම් ප්‍රකාශයේ දැක්වෙන යන්ත්‍ර ක්ෂය වටිනාකම

(1) රු. 90 000 කි. (2) රු. 100 000 කි. (3) රු. 180 000 කි. (4) රු. 320 000 කි.

- පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගෙන අංක **35** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජානකගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමෙන් උපුටා ගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| ප්‍රාග්ධනය | 300 000 |
| තොගය (2017.01.01දිනට) | 40 000 |
| විකුණුම් | 250 000 |
| ගැනුම් | 150 000 |
| ගෙන ඒමේ කුලී | 3 000 |
| ණයගැතියෝ | 35 000 |
| රක්ෂණ වියදම් | 18 000 |
| පරිපාලන වේතන | 26 000 |
| මූල්‍ය වියදම් | 4 000 |
| ලද වට්ටම් | 2 000 |
| වෙනත් ආදායම් | 5 000 |
| දුන් වට්ටම් | 10 000 |

අතිරේක තොරතුරු:

* 2017 වර්ෂය සඳහා රක්ෂණ ගාස්තුව රු. 20 000 කි.
* ණයගැතියන්ගෙන් රු. 3 000 ක් බොල් ණය ලෙස කපා හැරිය යුතු ය.
* 2017.12.31 දිනට ඉතිරි තොගයේ පිරිවැය රු. 30 000 කි.

**35.** 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය

(1) රු. 87 000 කි. (2) රු. 120 000 කි. (3) රු. 160 000 කි. (4) රු. 163 000 කි.

**36.** මෙම ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය
(1) රු. 87 000 කි. (2) රු. 90 000 කි. (3) රු. 130 000 කි. (4) රු. 163 000 කි.

**37.** මෙම ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී මුදලින් ගෙවා ඇති රක්ෂණ ගාස්තුව
(1) රු. 2 000 කි. (2) රු. 18 000 කි. (3) රු. 20 000 කි. (4) රු. 22 000 කි.

**38.** මෙම ව්‍යාපාරයේ 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු ණයගැති වටිනාකම
(1) රු. 3 000 කි. (2) රු. 32 000 කි. (3) රු. 35 000 කි. (4) රු. 38 000 කි.

**39.** මෙම ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය
(1) රු. 31 000 කි. (2) රු. 33 000 කි. (3) රු. 36 000 කි. (4) රු. 38 000 කි.

**40.** 2017.12.31 දිනට මෙම ව්‍යාපාරයේ අයිතිකරුගේ මුළු හිමිකම කොපමණ ද?
(1) රු. 331 000 (2) රු. 333 000 (3) රු. 336 000 (4) රු. 338 000

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

| විෂයය අංකය<br>பாட இலக்கம் | 60 | විෂයය<br>பாடம் | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය |
|---|---|---|---|

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 4 | 21. | 3 | 31. | 3 |
| 02. | 1 | 12. | 3 | 22. | 2 | 32. | 3 |
| 03. | 3 | 13. | 2 | 23. | 2 | 33. | 3 |
| 04. | 3 | 14. | 2 | 24. | 1 | 34. | 1 |
| 05. | 1 | 15. | 3 | 25. | 2 | 35. | 4 |
| 06. | 4 | 16. | 2 | 26. | 3 | 36. | 1 |
| 07. | 2 | 17. | 2 | 27. | 4 | 37. | 2 |
| 08. | 1 | 18. | 1 | 28. | 2 | 38. | 2 |
| 09. | 3 | 19. | 4 | 29. | 1 | 39. | 1 |
| 10. | 2 | 20. | 1 | 30. | 2 | 40. | 1 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40

# 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
## II පත්‍රය

1. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යවසායකත්ව කළමනාකරණය පිළිබඳ උපාධිධාරිණියක වන හලාවත පදිංචි උදාරි තම ප්‍රදේශයේ විශාල පොල් වතු හිමියන්ගෙන් ලෙලි සහිත පොල් මිල දී ගෙන කපාපු පොල්, කොප්පරා, පොල්කටු හා පොල් කෙඳි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදිත අපනයනය කිරීමේ ව්‍යාපාරයක් 'කප්රුක නිෂ්පාදිත' නමින් පවත්වා ගෙන යයි.

'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018 ඔක්තෝබර් 01 දිනට පහත ගිණුම් ශේෂ පැවතුණි.

| | රු. |
|---|---|
| • මුදල් ශේෂය | 12 000 |
| • ණයගැතියෝ | 18 000 |
| • ණයහිමියෝ | 50 000 |
| • උපකරණ | 250 000 |
| • ඉඩම් හා ගොඩනැගිලි | 100 000 |

2018 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් මාසය තුළදී පහත ගනුදෙනු සිදු විය.

| | රු. |
|---|---|
| • අත්පිට ගැනුම් (ලෙලි පොල්) | 200 000 |
| • ණයට ගැනුම් (ලෙලි පොල්) | 100 000 |
| • ණයට විකුණුම් | 200 000 |
| • අත්පිට විකුණුම් | 400 000 |
| • ගෙවූ නිෂ්පාදන සේවක වැටුප් | 70 000 |
| • නිෂ්පාදිත ප්‍රවාහනය සඳහා ගෙවූ වියදම් | 60 000 |
| • ගෙවූ ගෙන ඒමේ කුලී | 20 000 |
| • ගෙවිය යුතු විදුලි ගාස්තු | 6 000 |

විශාල පොල් ඉඩම් කැබලි කර විකිණීම හා පොල් කෘමි උවදුර හේතුවෙන් කාලීනව ලබා ගත හැකි පොල් ප්‍රමාණය අඩු වෙමින් පවතින බැවින් පොල් භාවිතයේදී සිදු වන නාස්තිය අවම කිරීමට උදාරි රසකාරක රහිත පිටි කළ පොල් නිෂ්පාදිතයක් හඳුන්වා දුන්නා ය.

එම නිෂ්පාදිතය, අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනයක් සඳහා ඉදිරිපත් කළ අතර, එහිදී හඳුනාගත් විදේශීය ගැනුම්කරුවකු පිටි කළ පොල් පැකට් 10 000 ක් සඳහා වන ඇණවුමක් විද්‍යුත් තැපැලෙන් (E-Mail) එවා ඇත. 2018 දෙසැම්බර් 31 දිනට පෙර එම තොග නැව්ගත කරන බව උදාරි විසින් දුරකථනයෙන් දැනුම් දී ඇත.

තම පිටි කළ පොල් නිෂ්පාදනය පුළුල් කිරීමට ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති බැවින් උදාරි රු. 500 000 ක බැංකු ණය මුදලක් අයදුම් කර ඇත. පොල් හා පොල් නිෂ්පාදිත ප්‍රවාහනය සඳහා රු. 300 000 කට කුඩා ලොරි රථයක් අමර මෝටර්ස් වෙතින් 2018.10.31 දින ණයට ලබා ගන්නා ලදී.

උපකරණ වාර්ෂිකව 12% බැගින් ක්ෂය කරන අතර, 2018.10.31 දිනට ඉතිරි තොග කිසිවක් නොවී ය.

(i) (අ) ඉහත සිද්ධියේ සඳහන් 'කප්රුක නිෂ්පාදිත ව්‍යාපාරය' අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ආ) මෙම ව්‍යාපාරයේ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලෙලි පොල් කුමන නිෂ්පාදන සාධකයකට අයත් වේ ද?

(ii) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ ශක්තියක්, දුර්වලතාවක්, අවස්ථාවක් හා තර්ජනයක් සඳහා නිදසුන බැගින් සිද්ධියෙන් උපුටා ලියන්න.

(iii) (අ) පහත සඳහන් ප්‍රකාශ අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යයට අයත් වේ ද?

1. පිටිකළ පොල් පැකට් නිෂ්පාදනය කිරීම
2. පිටිකළ පොල් පැකට් අපනයන ප්‍රවර්ධන මණ්ඩලයේ ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීම

(ආ) පහත සඳහන් ප්‍රකාශ කුමන කළමනාකරණ කාර්යයට අයත් වේ ද?

1. 2018.12.31 දිනට පෙර පිටිකළ පොල් පැකට් තොගය නැව්ගත කිරීමට තීරණය කිරීම
2. කුඩා ලොරි රථයක් ණයට ගැනීම

(iv) (අ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරය ලබා ගෙන ඇති උපකාරක සේවා **දෙකක්** සඳහන් කර, එම උපකාරක සේවා ලබා ගෙන ඇති බව තහවුරු කිරීමට සිද්ධියේ සඳහන් නිදසුන බැගින් ලියන්න. පිළිතුරු සැපයීමට පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න.

| උපකාරක සේවා | නිදසුන |
|---|---|
| 1. | |
| 2. | |

(v) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018.10.01 දිනට හිමිකම කොපමණ ද?

(vi) (අ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ ඍජු පිරිවැයක් හා වක්‍ර පිරිවැයක් වටිනාකම් සහිතව ලියන්න.

(ආ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ වගකීම් වැඩි වීමට බලපාන ගනුදෙනුවක් ලියන්න.

(vii) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018 ඔක්තෝබර් මාසය සඳහා පොදු ජර්නලය පිළියෙල කරන්න.

(viii) (අ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018.10.31 දිනට මුදල් ශේෂය කොපමණ ද?

(ආ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018.10.31 දිනට ජංගම වත්කමක් හා ජංගම වගකීමක් වටිනාකම් සහිතව ලියන්න.

(ix) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018 ඔක්තෝබර් මාසය සඳහා ශුද්ධ ලාභය ගණනය කරන්න.

(x) (අ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ හිමිකම් ගිණුමක් හා ආදායම් ගිණුමක් සඳහා නිදසුන බැගින් ලියන්න.

(ආ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018.10.31 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ අගය කොපමණ ද?

**(ලකුණු 02 × 10 = 20 යි)**

(i) (අ) ඒක පුද්ගල ව්‍යාපාර/ තනි පුද්ගල ව්‍යාපාර/ කේවල ස්වාමී ව්‍යාපාර/ පෞද්ගලික අංශයේ ව්‍යාපාර/ ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර/ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

*(ලකුණු 01 යි)*

(ආ) • ප්‍රාග්ධනය

*(ලකුණු 01 යි)*

(ii)

- ශක්තිය - උදාරි ව්‍යවසායකත්ව කළමනාකරණය පිළිබඳ උපාධිධාරිණියක් වීම
- දුර්වලතාව - ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති වීම
- අවස්ථාව - • උදාරි ජීවත්වන ප්‍රදේශයේ විශාල පොල්වතු තිබීම/ • අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ප්‍රදර්ශන සංවිධානය කිරීම
- තර්ජනය - • විශාල පොල් ඉඩම් කැබලි කර විකිණීම • පොල් කුරුමිණි උවදුර

*(ලකුණු ½ x 4 = 02 යි)*

(iii) (අ) 1. නිෂ්පාදිතය
2. ස්ථානය/ ප්‍රවර්ධනය

*(ලකුණු ½ x 2 = 01 යි)*

(ආ) 1. සැලසුම්කරණය
2. සංවිධානකරණය

*(ලකුණු ½ x 2 = 01 යි)*

(iv)

| උපකාරක සේවා | නිදසුන |
|---|---|
| 1. සන්නිවේදනය | • දුරකථන භාවිත කිරීම<br>• විද්‍යුත් තැපෑල භාවිත කිරීම |
| 2. බැංකු සේවය | ණය මුදලක් අයදුම් කර තිබීම |
| 3. ප්‍රවාහනය | • ප්‍රවාහන වියදම් ගෙවා තිබීම<br>• ගෙන ඒමේ කුලී ගෙවා තිබීම<br>• තොග නැව්ගත කරන බව දන්වා තිබීම<br>• ලොරි රථයක් ණයට ලබා ගෙන තිබීම |

*(ලකුණු ½ x 4 = 02 යි)*

(v) රු. 330 000 *(ලකුණු 02)*

හෝ

(12 000 + 18 000+250 000 + 100 000) - 50 000 =330 000

(½) (½)

හෝ

(380 000 -50 000) = 330 000

(½) (½)

(vi) (අ)

- සෘජු පිරිවැය -

| | |
|---|---|
| ලෙලි පොල් ගැනුම් (අත්පිට) | රු. 200 000 |
| ලෙලි පොල් ගැනුම් (ණයට) | රු. 100 000 |
| නිෂ්පාදන සේවක වැටුප් | රු. 70 000 |
| ගෙන ඒමේ කුලී | රු. 20 000 |

*(ඕනෑම එක් අයිතමයකට ලකුණු ½ )*

- වක්‍ර පිරිවැය -

| | |
|---|---|
| නිෂ්පාදිත ප්‍රවාහන වියදම් | රු. 60 000 |
| විදුලි ගාස්තු | රු. 6 000 |
| උපකරණ ක්ෂය | රු. 2 500 |

*(ඕනෑම එක් අයිතමයකට ලකුණු ½)*

(ආ)

- රු. 300 000 කට මෝටර් රථයක් අමර මෝටර්ස් වෙතින් ණයට ගැනීම
- ලෙලි පොල් ණයට ගැනුම් රු.100 000
- උපචිත විදුලි ගාස්තු රු.6 000

*(ඕනෑම එක් අයිතමයකට ලකුණු 1)*

(vii)

**පොදු ජර්නලය**

| | දිනය | ජර්නල් ව.අ. | විස්තරය | ස. පි. | හර රු. | බැර රු. |
|---|---|---|---|---|---|---|
| 01 | 2018.10.01 | | මුදල් ගිණුම හර | | 12 000 | |
| | | | ණයගැති ගිණුම් හර | | 18 000 | |
| | | | උපකරණ ගිණුම හර | | 250 000 | |
| | | | ඉඩම් හා ගොඩනැගිලි ගිණුම හර | | 100 000 | |
| | | | ණයහිමි ගිණුම් | | | 50 000 |
| | | | ප්‍රාග්ධන ගිණුම | | | 330 000 |
| | | | | | 380 000 | 380 000 |
| | | | (2018.10.01 දිනට වත්කම්, වගකීම් හා හිමිකම් සටහන් කිරීම) | | | |
| 02 | 2018.10.31 | | විදුලි ගාස්තු ගිණුම හර | | 6 000 | |
| | | | ගෙවිය යුතු විදුලි ගාස්තු ගිණුම | | | 6 000 |
| | | | (ගෙවිය යුතු විදුලි ගාස්තු රු.6 000 සටහන් කිරීම) | | | |
| 03 | | | මෝටර් රථ ගිණුම හර | | 300 000 | |
| | | | අමර මෝටර්ස් ගිණුම | | | 300 000 |
| | | | (අමර මෝටර්ස් වෙතින් රු.300 000 ක් වටිනා මෝටර් රථයක් ණයට ගැනීම සටහන් කිරීම) | | | |
| 04 | | | උපකරණ ක්ෂය ගිණුම හර | | 2 500 | |
| | | | උපකරණ ක්ෂය වෙන්කිරීමේ ගිණුම | | | 2 500 |
| | | | (මාසික උපකරණ ක්ෂය රු.2 500 සටහන් කිරීම) | | | |

*(ලකුණු 02)*

(viii) අ - රු. 62 000 *(ලකුණු 01)*

හෝ

**මුදල් පොත**

| දිනය | ල.අ. | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | ල.අ. | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10.01 | | ශේෂය | (½) | 12 000 | | | ගැණුම් | | 200 000 |
| | | විකුණුම් | | 400 000 | | | නිෂ්පාදක සේවක | | 70 000 (½) |
| | | | | | | | වැටුප් | | 60 000 |
| | | | | | | | ප්‍රවාහන වියදම් | | 20 000 |
| | | | | | | | ගෙන ඒමේ කුලී | | 62 000 |
| | | | | 412 000 | | | 2018.10.31 ශේෂ/ප/ගෙ | | 412 000 |
| | | 11.01 ශේෂය/ඉ/ගෙ | | 62 000 | | | | | |

(viii) (ආ) **ජංගම වත්කම්**

- මුදල් රු. 62 000
- ණය ගැතියෝ රු. 218 000

*(ඕනෑම එක් අයිතමයකට ලකුණු ½)*

**ජංගම වගකීම්**

- ණයහිමියෝ රු. 150 000
- උපචිත විදුලි ගාස්තු රු. 6 000

*(ඕනෑම එක් අයිතමයකට ලකුණු ½)*

(ix) **කප්රුක නිෂ්පාදිත ව්‍යාපාරයේ**
**2018.10.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශය**

| | | රු. | රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| අත්පිට විකුණුම් | (½) | 400 000 | |
| ණයට විකුණුම් | | 200 000 | |
| | | | 600 000 |
| අඩුකලා : **වියදම්** | | | |
| අත්පිට ගැනුම් | | 200 000 | |
| ණයට ගැනුම් | | 100 000 | |
| නිෂ්පාදන සේවක වැටුප් | (½) | 70 000 | |
| ප්‍රවාහන වියදම් | | 60 000 | |
| ගෙන ඒමේ කුලී | | 20 000 | |
| විදුලි ගාස්තු | (½) | 6 000 | |
| උපකරණ ක්ෂය | | 2 500 | (458 500) |
| ශුද්ධ ලාභය | | | (½) 141 500 |

*(ලකුණු 02 යි)*

(x) (අ) <u>හිමිකම් ගිණුම්</u>

- ප්‍රාග්ධන ගිණුම

(ලකුණු ½යි)

<u>ආදායම් ගිණුම්</u>

- විකුණුම් ගිණුම

(ලකුණු ½යි)

(ආ) රු. 647 500 (ලකුණු 01 යි)

හෝ

$$\underbrace{(250\,000 + 100\,000 + 300\,000)}_{(½)} - \underbrace{2\,500}_{(½)} = 647\,500$$

01

| i | | ii | iii | | iv | v | vi | | vii | viii | | ix | x | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අ | ආ | | අ | ආ | | | අ | ආ | | අ | ආ | | අ | ආ | |
| 01 | 01 | 02 | 01 | 01 | 02 | 02 | 01 | 01 | 02 | 01 | 01 | 02 | 01 | 01 | 20/20 |

# I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

2. (i) (අ) මිනිස් අවශ්‍යතාවක් යනු කුමක් ද?

(ආ) මිනිස් අවශ්‍යතාවල ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරය තුළින් විවිධ අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කරන සේවකයෝ එම ව්‍යාපාරයේ බාහිර පරිසරයට අයත් වේ.

(ආ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ව්‍යාපාර භාවිත කරන ස්වාභාවික සම්පත් ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.

(ඉ) සමුපකාර සමිති ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයකි.

(ඊ) නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාර භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා සපයන ව්‍යාපාර ලෙස වර්ග කළ හැකි ය. (ලකුණු 02 යි)

(iii) අමා සහ රසාංගා ඇඹිලිපිටියේ පදිංචි පසිඳුගෙන් නැවුම් කිරි මිලට ගෙන, මීකිරි නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 'අමරස මීකිරි' නමින් පවත්වා ගෙන යයි.

(අ) මෙම සිද්ධියේ සඳහන් වන අමරස මීකිරි ව්‍යාපාරය විසින් සපුරාලන මිනිස් වුවමනාව කුමක් ද?

(ආ) මෙම සිද්ධියේ සඳහන් පසිඳුගේ ව්‍යාපාර සංවිධාන වර්ගයට සාපේක්ෂව 'අමරස මීකිරි' නිෂ්පාදන ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

(iv) ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇමරිකානු ඩොලරයේ මිල ඉහළ යාම නිසා ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ආනයන වියදම ඉහළ ගොස් ඇත.

(අ) ඉහත ප්‍රකාශයෙන් ගම්‍ය වන ව්‍යාපාර පරිසර සාධකය කුමක් ද?

(ආ) ඛනිජ තෙල් භාවිතය අවම කිරීම සඳහා ආදේශකයක් යෝජනා කරන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

(i) (අ) ජීවත් වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන් ම සපුරා ගත යුතු දෑ මිනිස් අවශ්‍යතා වේ.

**(ලකුණු 01)**

(ආ)
- අත්‍යවශ්‍ය වීම
- පොදු වීම
- ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ නො හැකි වීම
- සීමිත බව

(½ x 2 = *ලකුණු 01 යි)*

(ii) (අ) අසත්‍යයි

(ආ) අසත්‍යයි

(ඉ) සත්‍යයි

(ඊ) සත්‍යයි

(½ x 4 = *ලකුණු 02 යි)*

(iii) (අ) - මී කිරි (ලකුණු 01)

(ආ)
- වැඩි ප්‍රාග්ධනයක් සපයා ගත හැකි වීම
- අලාභ දෙදෙනෙකු අතර බෙදී යාම
- සාමූහික ව තීරණ ගත හැකි වීම
- වගකීම දෙදෙනෙකු අතරේ බෙදී යාම
- දෙදෙනාගේ ම දක්ෂතා ව්‍යාපාරයට යොදා ගත හැකි වීම

*(½ x 2 = ලකුණු 01 යි)*

(iv) (අ) ආර්ථික පරිසරය *(ලකුණු 01 යි)*

(ආ)
- ගෑස් භාවිත කිරීම
- විදුලිය භාවිත කිරීම
- සූර්ය බලය භාවිත කිරීම
- ජීව වායු භාවිත කිරීම
- සත්ව බලය භාවිත කිරීම
- මිනිස් බලය භාවිත කිරීම
- ගල් අඟුරු භාවිතය

*(ඕනෑම එක් අයිතමයකට ලකුණු 01)*

02

| i | | ii | | | | iii | | iv | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අ | ආ | අ | ආ | ඉ | ඊ | අ | ආ | අ | ආ | |
| 01 | 01 | ½ | ½ | ½ | ½ | 01 | 01 | 01 | 01 | 08/08 |

3. (i) (අ) සිල්ලර වෙළෙඳාම යනු කුමක් ද?
(ආ) වාණිජ බැංකුවක පවත්වා ගෙන යන ගිණුම් වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.
(අ) සිල්ලර වෙළෙඳාම හා තොග වෙළෙඳාම අතර ඇති ප්‍රධානතම වෙනස වන්නේ මිල දී ගන්නාගේ චේතනාව ය.
(ආ) විශේෂ රේඛනය සහිත චෙක්පතක් ඕනෑම වාණිජ බැංකුවක ඇති ජංගම ගිණුමක තැන්පත් කළ හැකි ය.
(ඉ) දේපළ රක්ෂණයේදී අවදානම නිශ්චිත වන අතර ජීවිත රක්ෂණයේදී අවදානම අනිශ්චිත වේ.
(ඊ) සන්නිවේදන ක්‍රියාවලියේදී ප්‍රතිචාරය යවන්නා ප්‍රතිචාරය සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය ප්‍රතිචාරයයි.
(ලකුණු 02 යි)

(iii) සාරංගා බතික් නිෂ්පාදකයෝ විසින් බතික් නිර්මාණ තොගයක් සිංගප්පූරුවේ සිටින රමේෂ්ට ගුවන් මගින් යවන ලදී.
(අ) මෙහි සඳහන් ආනයනකරු හා අපනයනකරු නම් කරන්න.
(ආ) මෙහි සඳහන් ප්‍රවාහන ක්‍රමයට අදාළ ප්‍රවාහන මූලිකාංග වන මාර්ගය හා මාධ්‍යය සඳහා නිදසුන් වෙන වෙන ම දක්වන්න.
(ලකුණු 02 යි)

(iv) විමල්ගේ රු. 2 000 000 ක් වටිනා මෝටර් රථය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ එම වටිනාකමට රක්ෂණය කර තිබූ අතර එම රථය අනතුරකට භාජනය වී රු. 500 000 ක අලාභයක් සිදු විය. එම අවස්ථාවේ පදික වේදිකාවේ ගමන් කරමින් සිටි සුනිමල්ට ද සුළු තුවාල සිදු විය.
ඉහත සිද්ධියේ රක්ෂණයට සම්බන්ධ පහත ඇ සඳහන් කරන්න.
(අ) පළමු පාර්ශ්වය
(ආ) දෙවන පාර්ශ්වය
(ඉ) තෙවන පාර්ශ්වය
(ඊ) විමල්ට ලැබෙන වන්දි මුදල
(ලකුණු 02 යි)
**(මුළු ලකුණු 08 යි)**

(i) (අ) • අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා විකිණීම සිල්ලර වෙළෙඳාමයි.

*(ලකුණු 01 යි)*

(ආ)
- ඉතිරි කිරීමේ ගිණුම්
- ස්ථාවර තැන්පත් ගිණුම්
- ජංගම ගිණුම්

*(½ x 2 = ලකුණු 01 යි)*

(ii) (අ) සත්‍යයි

(ආ) අසත්‍යයි

(ඉ) අසත්‍යයි

(ඊ) අසත්‍යයි

*(½ x 4 = ලකුණු 02 යි)*

(iii) (අ)

- ආනයනකරු - රමේෂ්
- අපනයනකරු - සාරංගා බතික් නිෂ්පාදකයෝ

*(½ x 2 = ලකුණු 01 යි)*

(ආ) • මාර්ගය - ගුවන් මාර්ග

• මාධ්‍යය - ගුවන්යානය

(½ x 2 = ලකුණු 01 යි)

(iv) (අ) (අ) විමල්

(ආ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

(ඉ) සුනිමල්

(ඊ) රුපියල් : 5,00 000

(½ x 4 = ලකුණු 02 යි)

03

| i | | ii | | | | iii | | iv | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අ | ආ | අ | ආ | ඉ | ඊ | අ | ආ | අ | ආ | ඉ | ඊ | |
| 01 | 01 | ½ | ½ | ½ | ½ | 01 | 01 | ½ | ½ | ½ | ½ | 08/08 |

4. (i) (අ) 'කළමනාකරණය' යනු කුමක් ද?
(ආ) සාමාන්‍ය කොටස්වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.
(අ) ව්‍යාපාරය සැලසුම් කළ කටයුතු ඒ ආකාරයෙන්ම සිදු වී ඇත් දැයි සොයා බැලීම සැලසුම්කරණයයි.
(ආ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ෂණීය ලෙස මෙන්ම ලාභදායි ලෙස තෘප්තිමත් කළ හැකි පාරිභෝගික කොටස ඉලක්ක වෙළෙඳපොළ වේ.
(ඉ) ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුත්තේ එම ආයෝජනයේ අවදානම පමණි.
(ඊ) පුද්ගලයකු උපයා ගත් ආදායමෙන් ඉතිරි කර ගත් මුදලක් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායි මාර්ගයක යෙදවීම ආයෝජනය නම් වේ.
(ලකුණු 02 යි)

(iii) ඉහළ අවදානම් දැරීමට අකැමැති රත්නා විසින් රු. 1 200 000 කට මිලට ගත් ඉඩම් කැබැල්ල වර්ෂයකට පසු රු. 1 500 000 කට විකුණන ලදී. ඇය මෙම මුදල ඉදිරි මාසය තුළදී තම දියණියගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා යෙදවීමට අපේක්ෂා කරයි.
(අ) ඉඩම විකිණීම නිසා රත්නාට ලැබුණු ප්‍රතිලාභයේ වටිනාකම කොපමණ ද?
(ආ) ඉහත (අ) හි ප්‍රතිලාභය හඳුන්වන නාමය කුමක් ද?
(ඉ) දියණියගේ අධ්‍යාපන කටයුතුවලට යොදවන තෙක් රත්නාගේ මුදල් ආයෝජනය කිරීමට වඩාත් සුදුසු ආයෝජන මාර්ගය කුමක් ද?
(ඊ) ඉහත (ඉ) හි ඔබගේ යෝජනාවට හේතුව දක්වන්න.
(ලකුණු 02 යි)

(iv) පාසලේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව සඳහා 2018 මාර්තු මස 31 වන දින අනුරාධපුරය හා පොළොන්නරුව නැරඹීමට සංවිධායකයින් විසින් තීරණය කරන ලදී. ප්‍රථමාධාර සහ සංග්‍රහ කමිටු සඳහා සිසුන් පත් කරන ලදී. චාරිකාව නිමවූ පසු, එහි ප්‍රගතිය පිළිබඳව විදුහල්පතිතුමා විමසූ අතර, පන්ති භාර ගුරුතුමිය විසින් චාරිකාවේ වාර්තාව ද සපයන ලදී.
(අ) ඉහත සිද්ධියේ සඳහන් වන කළමනාකරණ කාර්ය **දෙකක්** සඳහන් කරන්න.
(ආ) ඉහත 'අ' හි සඳහන් කළ එක් එක් කළමනාකරණ කාර්යය සඳහා නිදසුන බැගින් ලියන්න.
(ලකුණු 02 යි)
**(මුළු ලකුණු 08 යි)**

(i)　(අ)

ව්‍යාපාර අරමුණක් සඵලදායීව ඉටු කර ගැනීම සඳහා පවතින සම්පත්, කාර්යක්ෂමව යොදා ගනිමින් එම ව්‍යාපාරයේ කටයුතු සැලසුම්කරණය කිරීමේ, සංවිධානකරණය කිරීමේ, මෙහෙයවීමේ හා පාලනය කිරීමේ ක්‍රියාවලියයි.

*(ලකුණු 01 යි)*

(ආ)
- ලාභාංශ ආදායම් ලැබීම
- ප්‍රාග්ධන ලාභ ලැබීම
- ඡන්ද බලය ලැබීම
- සමාගමේ හිමිකාරත්වය ලැබීම
- අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට හැකි වීම

*(½ x 2 = ලකුණු 01 යි)*

(ii)　(අ)　-　අසත්‍යයි.

(ආ)　-　සත්‍යයි.

(ඉ)　-　අසත්‍යයි.

(ඊ)　-　සත්‍යයි.

*(½ x 4 = ලකුණු 02 යි)*

(iii)　(අ)　රු. 300 000

(ආ)　ප්‍රාග්ධන ලාභය

(ඉ)
- ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීම　හෝ
- එක් මාසයක ස්ථාවර තැන්පතු ගිණුමක් ආරම්භ කිරීම

(ඊ)
- රත්නා අවදානම් දැරීමට අකමැති වීම　හෝ
- එක් මසකින් මුදල් ආපසු ලබා ගැනීමේ අවශ්‍යතාව　*(½ x 4 = ලකුණු 02 යි)*

(iv)

| (අ) | (ආ) |
|---|---|
| • සැලසුම්කරණය | අනුරාධපුරය හා පොළොන්නරුව නැරඹීමට තීරණය කිරීම |
| • සංවිධානකරණය | ප්‍රථමාධාර හා සංග්‍රහ කමිටු සඳහා සිසුන් පත් කිරීම |
| • පාලනය | • විදුහල්පති චාරිකාවේ ප්‍රගතිය විමසීම<br>• පන්තිභාර ගුරුතුමිය චාරිකාවේ වාර්තාව සැපයීම |

*(½ x 4 = ලකුණු 02 යි)*

04

| i | | ii | | | | iii | | | | iv | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අ | ආ | අ | ආ | ඉ | ඊ | අ | ආ | ඉ | ඊ | අ | ආ | |
| 01 | 01 | ½ | ½ | ½ | ½ | ½ | ½ | ½ | ½ | 01 | 01 | 08/08 |

## II කොටස - ගිණුම්කරණය

**5.** (i) (අ) වත්කමක් යනු කුමක් ද?
(ආ) හිමිකම් ගිණුම්වලට අදාළ ද්විත්ව සටහන් මූලධර්මය ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් වන්නේ ලී බඩු වෙළෙඳසැලක සිදු වූ ගනුදෙනු දෙකකි.
(අ) කළමනාකරුගේ ප්‍රයෝජනය සඳහා විධායක පුටුවක් රු. 20 000 කට ලක්මල් ලී බඩු වෙළෙඳසැලෙන් ණයට ගැනීම
(ආ) රු. 15 000 ක මේසයක් කසුන්ට ණයට විකිණීම
ඉහත එක් එක් ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) විදුලි උපකරණ අලෙවි කරන සමන්තගේ ව්‍යාපාරයේ 2018 ජනවාරි 31 දිනෙන් අවසන් වූ මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. රු. 100 000 ක බැංකු ණය මුදලක් ලබා ගැනීම
2. රු. 50 000 ක් වටිනා විදුලි උපකරණ තොගයක් ණයට ගැනීම
3. ණයහිමියන්ට රු. 8 000 ක් මුදලින් ගෙවීම
4. රු. 25 000 ක් පිරිවැය වූ විදුලි උපකරණ තොගයක් රු. 40 000 කට අත්පිට මුදලට විකිණීම
5. සමන්ත පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 5 000 ක් ව්‍යාපාරයේ මුදලින් ගැනීම

**අවශ්‍ය වන්නේ:**
(අ) ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දැක්වීම
(පිළිතුරු සැපයීමේදී පහත දැක්වෙන ආකෘතිය භාවිත කරන්න. පළමු ගනුදෙනුව සටහන් කර ඇත.)

| ගනුදෙනුව | වත්කම් (රු.) | | | = හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|---|---|
| | ලීබඩු හා උපකරණ | තොගය | මුදල් | හිමිකම් | බැංකු ණය | ණයහිමියෝ |
| 2018.01.01 දිනට ශේෂය | 160 000 | 70 000 | 25 000 | 235 000 | – | 20 000 |
| 1 | – | | + 100 000 | | + 100 000 | – |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |

(ආ) 2018.01.31 දිනට සමන්තගේ ව්‍යාපාරයේ පහත සඳහන් අයිතමවල අගය කොපමණ ද?
1. ජංගම වත්කම්
2. ජංගම නොවන වත්කම්
3. ජංගම වගකීම්
4. ජංගම නොවන වගකීම් (ලකුණු 04 යි)

(iv) තුෂාරගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2018 මැයි මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. 2018.05.03 – එකක් රු. 200 බැගින් තේ කොළ පැකට් 20 ක් සමීරගෙන් ණයට ගැනීම (ඉන්. අංක 612) අඩු කළ වෙළෙඳ වට්ටම 5%
2. 2018.05.05 – එකක් රු. 15 බැගින් බිත්තර 20 ක් අත්පිට මුදලට ගැනීම (ලදුපත් අංක 25)
3. 2018.05.18 – එකක් රු. 5.00 බැගින් ගිනි පෙට්ටි 100 ක් පහන්ගෙන් ණයට ගැනීම (ඉන්. අංක 305)
4. 2018.05.23 – ටෙක්නෝ වෙළෙන්දෝ වෙතින් රු. 25 000 ක් වටිනා පරිගණක මේසයක් ණයට ගැනීම

**අවශ්‍ය වන්නේ:**
(අ) 2018 මැයි මාසය සඳහා තුෂාරගේ ව්‍යාපාරයේ ගැනුම් ජර්නලය පිළියෙල කිරීම
(ආ) 2018.05.31 දිනට ගැනුම් ජර්නලයේ තොරතුරු ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

(i)

(අ) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන්නා වූ ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පතකි.

(ලකුණු 01 යි)

(ආ) හිමිකම් අඩුවීම හර
හිමිකම් වැඩිවීම බැර

(ලකුණු 01 යි)

(ii)

| මූලාශ්‍ර ලේඛන | මූලික සටහන් පොත |
|---|---|
| (අ) ජ'නල් වවුචරය | පොදු ජ'නලය |
| (ආ) විකුණුම් ඉන්වොයිසිය | විකුණුම් ජ'නලය |

($\frac{1}{2}$ x 4 = ලකුණු 02 යි)

(iii) (අ)

| ගනුදෙනුව | වත්කම් රු. | | | = හිමිකම් (රු) + | වගකීම් (රු) | | |
|---|---|---|---|---|---|---|---|
| | ලී බඩු හා උපකරණ | තොගය | මුදල් | හිමිකම් | බැංකු ණය | ණය හිමියෝ | |
| 2018.01.01 දිනට ශේෂය | 160 000 | 70 000 | 25 000 | 235 000 | - | 20 000 | |
| 1 | | | +1 00 000 | | +100 000 | | |
| 2 | | +50 000 | | | | +50 000 | ($\frac{1}{2}$) |
| 3 | | | -8 000 | | | -8 000 | ($\frac{1}{2}$) |
| 4 | | -25 000 | +40 000 | +15 000 | | | ($\frac{1}{2}$) |
| 5 | | | -5 000 | -5 000 | | | ($\frac{1}{2}$) |

(ලකුණු 02 යි)

(ආ) 1. ජංගම වත්කම් - රු. 247 000

2. ජංගම නොවන වත්කම් - රු. 160 000

3. ජංගම වගකීම් - රු. 62 000

4. ජංගම නොවන වගකීම් - රු. 100 000

($\frac{1}{2}$ x 4 = ලකුණු 02 යි)

(iv) (අ)

### ගැනුම් ජ'නලය

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | මුළු වටිනාකම රු. | ලෙ.පි. |
|---|---|---|---|---|
| 2018.05.03 | 612 | සමීර | 3 800 (½) | |
| 2018.05.18 | 305 | පහන් | 500 (½) | |
| 2018.05.31 | | ගැනුම් ගිණුමට හර කළා | 4 300 (½) | |

(½)

(ලකුණු 02 යි)

(ආ)

### ගැනුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු.. |
|---|---|---|---|---|---|---|---|
| 2018.05.31 | ණයහිමි ගිණුම් | | 4 300 (½) | | | | |

### සමීරගේ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තර | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2018.05.03 | ගැනුම් ගිණුම | | 3 800 (½) |

### පහන්ගේ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තර | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2018.05.18 | ගැනුම් ගිණුම | | 500 (½) |

- නිවැරදි ආකෘතිය සහිත ගිණුම් තුනට ලකුණු (½)

*(ලකුණු 02 යි)*

*(මුළු ලකුණු 12 යි)*

(05)

| i | | ii | | iii | | iv | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| අ | ආ | අ | ආ | අ | ආ | අ | ආ | |
| 01 | 01 | 01 | 01 | 02 | 02 | 02 | 02 | 12/12 |

6. (i) (අ) බැංකු ප්‍රකාශය යනු කුමක් ද?

(ආ) ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශයේ ශේෂය වෙනස්වීමට හේතු විය හැකි කරුණු **දෙකක්** ලියන්න.

(ලකුණු 02 යි)

(ii) අල්මාරි නිෂ්පාදනය කරන සඳුන්ගේ ව්‍යාපාරයේ 2018 නොවැම්බර් මාසයේ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| * ලී සඳහා වියදම | රු. 100 000 |
| * මාසික විදුලි ගාස්තුව | රු. 2 500 |
| * වඩු කාර්මික වැටුප් | රු. 60 000 |
| * වෙනත් සෘජු වියදම් | රු. 17 500 |
| * වඩු මඩුවේ කුලිය | රු. 20 000 |

නොවැම්බර් මාසය තුළ නිෂ්පාදනය කළ අල්මාරි ගණන 5 කි. අල්මාරියක විකුණුම් මිල රු. 50 000 කි.

**අවශ්‍ය වන්නේ:**

(අ) 2018 නොවැම්බර් මාසයට අදාළ ප්‍රාථමික පිරිවැය

(ආ) එක් අල්මාරියක් විකිණීමෙන් ලැබෙන ලාභය

(ලකුණු 02 යි)

(iii) (අ) ව්‍යාපාරයක ගිණුම් තැබීමේදී සිදු වූ වැරදි නිවැරදි කිරීම සඳහා තබා තිබූ අසම්පූර්ණ ජර්නල් සටහන් දෙකක් පහත දැක්වේ.

**පොදු ජර්නලය**

| | දිනය | වවුචර් අංකය | විස්තරය | ලෙ.පි | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|---|---|---|
| (1) | 2018.03.31 | 101 | ගැනුම් ගිණුම හර<br>ණයහිමි ගිණුම<br>(..............................) | | 40 000 | 40 000 |
| (2) | | 102 | කාර්යාල උපකරණ ගිණුම හර<br>ගැනුම් ගිණුම<br>(..............................) | | 20 000 | 20 000 |

**අවශ්‍ය වන්නේ:**

ඉහත වැරදි නිවැරදි කිරීම්වලට අදාළ සංලක්ෂ්‍ය වෙන වෙන ම ලියා දැක්වීම

(ලකුණු 02 යි)

(ආ) සුමුදුගේ ව්‍යාපාරයේ 2018.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම සමාන නොවූයෙන් වෙනස අවිනිශ්චිත ගිණුමට මාරු කරන ලදී.
පහත දැක්වෙන්නේ සුමුදුගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමෙන් පසු පිළියෙල කරන ලද අවිනිශ්චිත ගිණුමයි.

**අවිනිශ්චිත ගිණුම**

| දිනය | විස්තරය | ස/පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස/පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| | ශේෂ පිරික්සුමේ වෙනස | | ......... | | උපකරණ ගිණුම | | 12 000 |
| | විකුණුම් ගිණුම | | 5 000 | | විදුලි ගාස්තු ගිණුම | | 4 000 |
| | ගැනුම් ගිණුම | | 2 000 | | | | |

**අවශ්‍ය වන්නේ:**

1. වැරදි නිවැරදි කිරීමට පෙර ශේෂ පිරික්සුමේ වෙනස
2. අවිනිශ්චිත ගිණුමේ ශේෂය ඇතුළත් කිරීමට පෙර 2018.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු. 85 000 වූයේ නම් ශේෂ පිරික්සුමේ බැර තීරුවේ එකතුව

(ලකුණු 02 යි)

(iv) 2018.10.31 දිනට සපුමල්ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර ශේෂය රු. 16 000 ක් විය. එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය එම ශේෂය හා නොගැළපුණි.
පසුව වෙනසට හේතු ලෙස පහත කරුණු අනාවරණය කර ගන්නා ලදී.
1. මාසය තුළ තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු. 5 000
2. බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකුව අය කළ ගාස්තු රු. 500
3. මාසය තුළදී නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම රු. 8 000
4. බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකුවට සෘජුවම ලැබුණු ණයගැති ප්‍රේෂණ රු. 2 000

**අවශ්‍ය වන්නේ:**
(අ) 2018.10.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම
(ආ) 2018.10.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම

(ලකුණු 04 යි)
**(මුළු ලකුණු 12 යි)**

(i) (අ) ජංගම ගිණුම් හිමියෙකුට අදාළ වාණිජ බැංකුව විසින් නිශ්චිත මාසයක් තුළ සිදු කළ ගනුදෙනු පිළිබඳ ව එවනු ලබන ප්‍රකාශයයි.

*(ලකුණු 01 යි)*

(ආ)
- නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්
- තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත්
- ණයගැති ප්‍රේෂණ
- බැංකුවට සෘජුව ම ලැබුණු ආදායම්
- ස්ථාවර නියෝග ගෙවීම්
- බැංකු ගාස්තු හා චෙක්පත් ගාස්තු

*(½ x 2 = ලකුණු 01 යි)*

(ii) (අ) රු. 177 500 *(ලකුණු 01 යි)*

**හෝ**

| | | |
|---|---|---|
| ලී සඳහා වියදම | රු. 100 000 | |
| වඩු කාර්මික වැටුප් | රු. 60 000 | |
| වෙනත් සෘජු වියදම් | රු. 17 500 | (½) |
| ප්‍රාථමික පිරිවැය | රු. 177 500 | |

(ආ) රු. 10 000 *(ලකුණු 01 යි)*

**හෝ**

| | |
|---|---|
| ප්‍රාථමික පිරිවැය | රු. 177 500 |
| විදුලි ගාස්තු | රු. 2 500 |
| වඩු මඩුවේ කුලිය | රු. 20 000 |
| මුළු පිරිවැය | රු 200 000 |

එක් අල්මාරියකට පිරිවැය = $\frac{200\ 000}{5}$ (½)
= රු. 40 000

අල්මාරියක විකුණුම් මිල = 50 000
එක් අල්මාරියක් විකිණීමෙන් ලැබෙන ලාභය = 50 000 - 40 000 (½)

රු. 10 000

(iii) (අ)

1.

- රු. 40 000 ක ගැනුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් ම පොත්වල සටහන් කිරීම මඟ හැරීම නිවැරදි කිරීම
- ගැනුම් ජර්නලයේ එකතුව රු. 40 000 ක් අඩුවෙන් එකතු වී තිබීම නිවැරදි කිරීම
- රු. 44 000 ක් වූ ගැනුම් ඉන්වොයිසියක් ගැනුම් ජර්නලයේ රු. 4 000 ක් ලෙස සටහන් කර තිබීම නිවැරදි කර තිබීම

2. • රු. 20 000 ක කාර්යාල උපකරණ ගැනුම්, ගැනුම් ගිණුමට හර කර තිබීම නිවැරදි කිරීම

*(1 x 2 = ලකුණු 02යි)*

(ආ) 1. රු. 9 000 *(ලකුණු 01 යි)*

අවිනිශ්චිත ගිණුම

| | රු. | | රු. |
|---|---|---|---|
| ශේෂ පිරික්සුමේ වෙනස | 9 000 | උපකරණ ගිණුම | 12 000 |
| විකුණුම් ගිණුම | 5 000 | විදුලි ගාස්තු ගිණුම | 4 000 |
| ගැනුම් ගිණුම | 2 000 | | |
| | 16 000 | | 16 000 |

2. - 85000 + 9000 = රු. 94 000 *(ලකුණු 01 යි)*

(iv) (අ)

බැංකු ගිණුම

| | රු | | රු. |
|---|---|---|---|
| 10.31 ශේෂය | 16 000 | බැංකු ගාස්තු | 500 (½) |
| ණයගැති ප්‍රේෂණ | 2 000 (½) | 10.31 ශේෂය ප/ගෙ | 17 500 (½) |
| | 18 000 | | 18 000 |
| 11.01 ශේෂය ඉ/ගෙ | 17 500 | | |

*(ලකුණු 01 1/2 යි)*

(ආ) **බැංකු සැසඳුම් විස්තරය**

| | රු: | රු: |
|---|---|---|
| බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය | | (½) 17 500 |
| එකතුකළා :-නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | | 8 000 (½) |
| | | 25 500 |
| අඩුකළා :- තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් | | (5 000) (½) |
| 2018.10.31 දිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය (½) | (½) | 20 500 |

*(ලකුණු 02 1/2 යි)*

06

| i | | ii | | iii | | iv | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| අ | ආ | අ | ආ | අ | ආ | අ | ආ | |
| 01 | 01 | 01 | 01 | 02 | 02 | 1 ½ | 2 ½ | 12/12 |

7. (i) (අ) තනි පුද්ගල ව්‍යාපාරයක පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන මොනවා ද?
(ආ) ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න. (ලකුණු 02 යි)

(ii) ලහිරු ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 60 දෙනෙකි. එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 1 000 කි. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ අසම්පූර්ණ ලැබීම් හා ගෙවීම් ගිණුම සහ ආදායම් ප්‍රකාශය පහත දැක්වේ.

**ලහිරු ක්‍රීඩා සමාජයේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| සාමාජික මුදල් | A | ලිපිද්‍රව්‍ය වියදම් | 5 000 |
| කොඩි විකිණීමෙන් ලැබීම් | 8 000 | ප්‍රවාහන ගාස්තු | 8 500 |
| | | උත්සව වියදම් | 12 500 |

**ලහිරු ක්‍රීඩා සමාජයේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| ආදායම්: | රු. |
|---|---|
| සාමාජික ගාස්තු | 60 000 |
| කොඩි විකිණීමෙන් ආදායම් | B |
| **වියදම්:** | |
| ප්‍රවාහන ගාස්තු | C |
| උත්සව වියදම් | 12 500 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 5 000 |

**අමතර තොරතුරු:**

- සාමාජිකයින් අටදෙනකු වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නැත.
- 2018.03.31 දිනට උපචිත ප්‍රවාහන ගාස්තු රු. 2 000 කි.
- කොඩි විකිණීමෙන් ලැබිය යුතු මුදල රු. 600 කි.

**අවශ්‍ය වන්නේ:**

(අ) ඉහත A, B හා C යන ස්ථාන සඳහා නිවැරදි වටිනාකම් වෙන වෙන ම

(ආ) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයේ අතිරික්තය හෝ ඌනතාව

(ලකුණු 02 යි)

(iii) කවිඳුගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැය) | 300 000 | |
| ප්‍රාග්ධනය | | 500 000 |
| බෙදාහැරීමේ මෝටර් රථය (පිරිවැයට) | 400 000 | |
| බෙදාහැරීමේ මෝටර්රථ ක්ෂය වෙන් කිරීම (2017.01.01 දිනට) | | 60 000 |
| 2017.01.01 දිනට තොගය | 25 000 | |
| 9% බැංකු ණය | | 100 000 |
| ගැනුම් | 150 000 | |
| විකුණුම් | | 240 000 |
| වේතන | 8 000 | |
| ණයගැතියෝ | 20 000 | |
| ණයහිමියෝ | | 17 000 |
| ලද වට්ටම් | | 3 000 |
| දුන් වට්ටම් | 1 000 | |
| ගෙන ඒමේ කුලී | 1 500 | |
| ගෙවූ බැංකු ණය පොලී | 4 500 | |
| බොල් ණය | 800 | |
| විදුලි ගාස්තු | 2 000 | |
| වරිපනම් | 200 | |
| මුදල් ශේෂය | 7 000 | |
| | 920 000 | 920 000 |

**අමතර තොරතුරු:**

* 2017.12.31 දිනට තොගය රු. 25 000
* බෙදාහැරීමේ රථ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කෙරේ.
* ණයගැතියන්ගෙන් රු. 1 200 ක් බොල් ණය ලෙස කපා හැරීමට තීරණය කරන ලදී.

**අවශ්‍ය වන්නේ:**

(අ) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය (ලකුණු 04 යි)

(ආ) 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

* * *

(i) (අ)

- ආදායම් ප්‍රකාශය / ලාභ හෝ අලාභ ප්‍රකාශය/ වෙළෙඳ හා ලාභාලාභ ගිණුම
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

*(ලකුණු 1/2 x 2 ලකුණු 01යි)*

(ආ)

- ලැබිය යුතු අදායම් ගිණුම — හර
  අදාළ ආදායම් ගිණුම — බැර

*(ලකුණු 01 යි)*

(ii) (අ) A - රු. 52 000

B - රු. 8 600

C - රු. 10 500

*(ලකුණු 1/2 x3 ලකුණු 01 1/2යි)*

(ආ) රු. 40 600

*(ලකුණු 1/2යි)*

හෝ

ළහිරු ක්‍රීඩා සමාජයේ
2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
අදායම් ප්‍රකාශය

| | රු. | රු. |
|---|---|---|
| ආදායම් | | |
| සාමාජික ගාස්තු | 60 000 | |
| කොඩි විකිණීමේ ආදායම | 8 600 | |
| | | 68 600 |
| වියදම් | | |
| ප්‍රවාහන ගාස්තු | 10 500 | |
| උත්සව වියදම් | 12 500 | |
| ලිපිද්‍රව්‍ය වියදම් | 5 000 | |
| | | (28 000) |
| අතිරික්තය | | (½) 40 600 |

(iii) (අ)

**කවිඳුගේ ව්‍යාපාරය**
**2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** (½)
**ලාභ හෝ අලාභ ප්‍රකාශය**

| | රු. | රු. | | රු. | රු. |
|---|---|---|---|---|---|
| 2017.01.01 දිනට තොගය | | 25 000 | විකුණුම් | | 240 000 |
| එකතු කළා : ගැණුම් | | 150 000 | | | |
| ගෙන ඒමේ කුලී | | 1 500 | | | |
| විකිණීමට ඇති තොග පිරිවැය | | 176 500 | | | |
| අඩු කළා :2017.12.31 තොගය | | (25 000) (½) | | | |
| විකුණුම් පිරිවැය | | 151 500 (½) | | | |
| දළ ලාභය ප/ගෙ | | 88 500 (½) | | | |
| | | 240 000 | | | 240 000 |
| <u>බෙදාහැරීමේ වියදම්</u> | | | | | |
| මෝටර් රථ ක්ෂය | 40 000 (½) | | දළ ලාභය | | 88 500 |
| බොල් ණය | 2 000 (½) | | ලද වට්ටම් | | 3 000 |
| දුන් වට්ටම් | 1 000 | | | | |
| | | 43 000 | | | |
| <u>පරිපාලන වියදම්</u> | | | | | |
| වේතන | 8 000 | | | | |
| විදුලිය | 2 000 | | | | |
| වරිපනම් | 200 | | | | |
| | | 10 200 | | | |
| <u>මූල්‍ය වියදම්</u> | | | | | |
| බැංකු ණය පොලී | 9 000 (½) | | | | |
| | | 9 000 | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා | (½) | 29 300 | | | |
| | | 91 500 | | | 91 500 |

*(ලකුණු 04 යි)*

(ආ)

කවිදුගේ ගේ ව්‍යාපාරය (½)

2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විස්තරය | රු. | රු. | විස්තරය | පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ධාරණ අගය රු. (½) |
|---|---|---|---|---|---|---|
| **හිමිකම්** | | | **ජංගම නොවන වත්කම්** | | | |
| 2017.01.01 ප්‍රාග්ධන | | 500 000 | ඉඩම් හා ගොඩනැගිලි | 300 000 | - | 300 000 |
| + ශුද්ධ ලාභය | | (½) 29 300 | මෝටර් රථ | 400 000 | 100 000 (½) | 300 000 |
| | | 529 300 | | 700 000 | 100 000 | 600 000 (½) |
| අඩු කළා - ශුද්ධ ලාභය | | | | | | |
| | | | **ජංගම වත්කම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | 2017.12.31 තොගය | | 25 000 (½) | |
| 9 % බැංකු ණය | | 100 000 | ණයගැතියෝ | | 18 800 (½) | |
| | | | මුදල් | | 7 000 | |
| **ජංගම වගකීම්** | | | | | | |
| ණයහිමියෝ | 17 000 | | | | | 50 800 |
| ගෙවිය යුතු බැංකු ණය පොලි | 4 500 (½) | 21 500 | | | | |
| | | 650 800 | | | | 650 800 |

*(ලකුණු 04 යි)*

(iii) (විකල්ප පිළිතුරකි)

(අ)

**කවිඳුගේ වෙළෙඳ ව්‍යාපාරය**
**2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ලාභ හෝ අලාභ ප්‍රකාශය** (½)

| විස්තරය | රු. | රු. | රු. |
|---|---|---|---|
| විකුණුම් | | | 240 000 |
| අඩු කළා : විකුණුම් පිරිවැය | | | |
| 2017.01.01 දිනට තොගය | | 25 000 | |
| ගැනුම් | | 150 000 | |
| ගෙන ඒමේ කුලී | | 1 500 | |
| අඩු කළා :2017.12.31 දිනට බඩු තොගය | | 176 500 | |
| දළ ලාභය | | (25 000) (½) | (151 500) (½) |
| ලද වට්ටම | | | 88 500 (½) |
| | | | 3 000 |
| වෙනත් ආදායම් | | | 91 500 |
| ලද වට්ටම් | | | |
| අඩු කළා : වියදම් | | | |
| බෙදාහැරීමේ වියදම් | | | |
| මෝටර් රථ ක්ෂය | 40 000 (½) | | |
| බොල් ණය | 2 000 (½) | | |
| දුන් වට්ටම් | 1 000 | | |
| | | (43 000) | |
| පරිපාලන වියදම් | | | |
| වේතන | 8 000 | | |
| විදුලි ගාස්තු | 2 000 | | |
| වරිපනම් | 200 | | |
| | | (10 200) | |
| මූල්‍ය වියදම් | | | |
| බැංකු ණය පොලී | 9 000 | 9 000 (½) | |
| | | | (62 200) |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා (½) | | | 29 300 |

*(ලකුණු 04 යි)*

(iii) (ආ)

කවිඳුගේ ව්‍යාපාරයේ
2017.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (½)

(½)

| විස්තරය | පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ධාරණ අගය රු. |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 300 000 | - (½) | 300 000 |
| බෙදා හැරීමේ මෝටර් රථය | 400 000 | 100 000 | 300 000 |
| | 700 000 | 100 000 | 600 000 (½) |
| **ජංගම වත්කම්** | | | |
| 2017.12.31 තොගය | | 25 000 (½) | |
| ණයගැතියෝ | | 18 800 (½) | |
| මුදල් | | 7 000 | 50 800 |
| | | | 650 800 |
| **හිමිකම්** | | | |
| 2017.01.01 දිනට ප්‍රාග්ධනය | | 500 000 | |
| එකතු කළා : ශුද්ධ ලාභය | | (½) 29 300 | 529 300 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| 9 % බැංකු ණය | | | 100 000 |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියෝ | | 17 000 | |
| උචිත බැංකු ණය පොළී | | 4 500 (½) | 21 500 |
| | | | 650 800 |

*(ලකුණු 04 යි)*
*(මුළු ලකුණු 12 යි)*

07

| i | | ii | | iii | | එකතුව |
|---|---|---|---|---|---|---|
| අ | ආ | අ | ආ | අ | ආ | |
| 01 | 01 | 01 | 01 | 04 | 04 | 12/12 |